**ජාතික ගමනාගමන කොමිෂන් සභාව - 2023**

**----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. **මා විසින් තවදුරටත්,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතයේ 87-76 ඡේදවලට අනුකූලව ජංගම හා ජංගම නොවන වත්කම් වර්ග කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි වෙනම දැක්විය යුතු වුවත් කොමිෂන් සභාවේ රු.30,685,625 ක් වූ ලැබිය යුතු ආපදා ණය ලැබිය යුතු කාලසීමාව මත ජංගම නොවන වත්කම් ලෙස දැක්වීම වෙනුවට එම ණය ශේෂය ජංගම වත්කම් යටතේ පමණක් දක්වා තිබුණි. | කෙටුම්පත් විගණකාධිපති වාර්තාවේ සඳහන් පරිදි 2024 කාශ ප්‍රවර්ෂය සඳහා මූල්‍යාන පිළියෙල කිරීමේදී රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ට 01 යුතු ආපදා ණය අනුකූලව ලැබිය ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස වෙන්කර දැක්වීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | ගිණුම් ප්‍රමිතිය ප්‍රකාරව ජංගම හා ජංගම නොවන වත්කම් වෙන වෙනම දැක්වීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද රු. 172,124,805ක වටිනා වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කෙටුම්පත් වාර්තාවේ දැක්වෙන ආකාරයට කොමිෂන් සභාව සතුව දැනට භාවිතයේ පවතින ශුන්‍ය ශුද්ධ අගයක් සහිත වත්කම් වල ප්‍රයෝජනවත් ජීවිත කාලය නැවත සමාලෝචනය කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව සඳහන් කරමි. | ගිණුම් ප්‍රමිතිය ප්‍රකාරව නැවත භාවිතා කිරීමට හැකි වන වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ටෙන්ඩර් තැන්පතු | 94,727,804 | ටෙන්ඩර් තැන්පතු ලේඛනය | 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් වටිනාකමට තුලනය වන ආකාරයට නියමිත පරිදි උපලේඛනය සකස් කර ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව සඳහන් කරමි. | ටෙන්ඩර් තැන්පතු ලේඛනයක් පවත්වා ගෙන යා යුතු වේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වවුනියා වැසිකිළි පද්ධතිය පවත්වාගෙන යාම වෙනුවෙන් 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලැබිය යුතු වටිනාකම රු.1,536,150ක් වූ නමුත් මෙම මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වව්නියාව වැසිකිලි පද්ධතිය නඩත්තු කිරීම වෙනුවන් ගිවිසුම්ගත ආයතනය විසින් ගෙවීම් නොකරන ලද වටිනාකම රු.1,536,150.00ක් වූ මුදල එම ආයතනය විසින් තබා තිබෙන රු.1,512,000.00 ක් වූ ලංසු සුරක්ෂණ මුදලින් අඩු කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු මුදල් ගිවිසුම් ප්‍රකාරව අප්‍රමාදව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත | | | |
| 18 වන වගන්තිය | පළාත් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර මගීන් ප්‍රවාහනය කිරීම සඳහා බස් රථ යෙදවීමට මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ බලතල කොමිෂන් සභාව සතු වුව ද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ද අන්තර් පළාත් මාර්ග සඳහා බලපත්‍ර 5ක් නිකුත් කර තිබුණි ද ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | අන්තර් පළාත් මාර්ග වල ධාවනය සඳහා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි විසින් නිකුත් කර ඇති මගී සේවා අවසර පත්‍ර ජාතික ගමනාගමන කොමිෂන් සභාව හරහා නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත . | පනත ප්‍රකාරව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම හා පැවරීම් සිදු කළ යුතු වේ. |

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | | | |
|---|---|---|---|
| 5.4.8 වගන්තිය | බැස්ටියන් මාවත බස් පර්යන්තයේ දිරාගිය කණු 80 ක් නවීකරණය කිරීම සඳහා කොන්ත්‍රාත්තුව රු.1,268,000 ක මුදලකට පෞද්ගලික සමාගමක් වෙත පවරා තිබුණු අතර සියයට 5ක කාර්යය සාධන සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු විසින්මෙම කාර්යයට අදාල කාර්යය සාධන සුරක්ෂණය ලබා ගැනීම අතපසු වී ඇත . කෙසේ වෙතත් ඉදිරියේදී මෙවැනි කරුණු සම්බන්ධයෙන් තවදුරටත් සැලකිලිමත්ව කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව වැඩිදුරටත් සඳහන් කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සුරක්ෂණයක් ලබා ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 492,915,436ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 181,260,633ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 311,654,803 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මාර්ග බලපත්‍ර ආදායම රු.332,392,537ක වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

2023 වර්ෂය තුළ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම තුල ඇතුලත් මාර්ග බලපත්‍ර ටෙන්ඩර් ආදායමට සියයට 150කින් වැඩි වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 2.22ක් වන අතර එය ඉකුත් වර්ෂයේ අනුපාතය වන 2.99ට සාපේක්ෂව අඩු අගයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මගී සේවා අවසර පත්‍රවලට අදාළ මාර්ග බලපත්‍ර 272ක් සඳහා වූ අළුත් කිරීමේ ආදායම, ටෙන්ඩර් බලපත්‍ර 27ක් සඳහා වූ ආදායම හා ඒ මත වූ දඩ මුදල රු.45,889,440 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අයකරගෙන නොතිබුණු අතර ගිණුම්වල හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විමසුමේ සඳහන් පරිදි අදාල හෙළිදරව් කිරීම් සිදුකිරීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමිවර්ෂය සඳහා මූල්‍ය | අයවිය යුතු මුදල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 සැප්තැම්බර් 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අමප/23/1597/608/060-1 අනුව 2019 වර්ෂයේ ආරම්භ කළ ශ්‍රී ලංකා ගමනාගමන කාඩ්පත් ව්‍යාපෘතිය වෙනුවෙන් කොමිෂන් සභාව රු.391,441ක් වියදම් දරා තිබුණු නමුත් ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ආරම්භ කර තිබුණු එම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය වන විට අසාර්ථක වීම මත නතර කර තිබුණි. | ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුව **මෙම ව්‍යාපෘතිය ඉදිරියට යාම පිලිබඳව ගැටළු සහගත තත්ත්වයක් පවතින හෙයින් මෙම සියළුම ගැටළු වලට විසඳුම් ලබා ගනිමින් නව ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් මන්ඩලය මගින් ප්‍රවාහන අමාත්‍යංශය වෙත මෙම කාර්යය පවරා තිබුණි. ඒ අනුව කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවේ නිරීක්ෂණය මත අදාල ඉදිරි කටයුතු ප්‍රවාහන අමාත්‍යංශය මගින් සිදු කරමින් පවතී.** | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව දින වකවානුවල වැය කටයුතු කිරීමේ වගකීම ආයතනය හා බැඳේ. |
| (ඇ) | 1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 8 වන වගන්තියේ කොමිෂන් සභා කර්තව්‍යය යටතේ මගී සේවා අවසර පත්‍ර ප්‍රදානය කිරීම හා පනතේ 24 වන වගන්තිය අනුව අවසර පත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාවට ප්‍රතිපාදන සලසා තිබුණි. කොමිෂන් සභාව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමේ නියමිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර මගී සේවා අවසර පත්‍ර ටෙන්ඩර් වටිනාකම, අවම තාක්ෂණික අගය මත, රු.3,000, රු.10,000 හා රු.15,000 යන වටිනාකම් මත ලබා දී තිබුණි. තව ද 2024 මැයි වන විට ද කොමිෂන් සභාව විසින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලස්වමින් ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට ද කටයුතු කර නොතිබුණි. | මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමත නව ක්‍රමවේදය හරහා මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී. මගී සේවා අවසර පත්‍ර ගාස්තු අය කිරීම සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටු වාර්තාව ජූනි මස පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර ඇත.<br><br>පනත් සංශෝධනය දැනටමත් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, එහි ත්‍රෛභාෂා පරිවර්තන කටයුතු සිදු කරමින් පවතින බව දැනුවත් කර ඇත. | පනත ප්‍රකාරව මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීමට නියමිත ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුවේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාවේ මහජන පැමිණිලි ඒකකය වෙත ලැබුණු 4,625 ක පැමිණිලි ප්‍රමාණයෙන් පැමිණිලි 3,476 ක් විමර්ශණය කර තිබුනු අතර පැමිණිලි 1,149 ක් තවදුරටත් විමර්ශණය කරමින් පවතින අතර එය මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 25 ක් පමණ විය. | අවසන් නොවූ 266ක් වන පැමිණිලි අතර, ජාතික ගමනාගමන කොමිෂන් සභාවට පැමිණිලි කිරීමට අමතරව පොලිස් ස්ථාන වෙත පැමිණිලි කර අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා තෙක් අවසන් නොවූ පැමිණිලි හා පරීක්ෂණ සඳහා සහභාගී නොවීම හේතුවෙන් | මහජන පැමිණිලි නොපමාව නිරාකරණය කිරීමට කටයුතු කළ යුතු වේ. |

පරීක්ෂණ අවසන් නොකරන ලද පැමිණිලි අඩංගු වේ. එමෙන්ම දැනට අවසන් නොවූ පැමිණිලි සඳහා සිහිකැඳවීම් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අන්තර් පළාත් නව දිගු දුර සංඥා කණු 300ක් ඉදිකිරීම සඳහා රු.10,340,000ක් වෙන්කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ දී රු.242,000ක් වැයකර සංඥා කණු 84ක් පමණ ඉදිකර තිබුණි. ඒ අනුව කණු 216ක් ඉදිකිරීමට නොහැකිව තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 72ක් පමණ විය. තව ද සංඥා කණු ඉදිකිරීමේ සත්‍ය පිරිවැය හා සැසඳීමේදී ඇස්තමේන්තු ගත පිරිවැය සියයට 90 කින් වැඩිපුර ගණනය කර තිබුණි. | දුර ගමන් සේවා බස් රථ සීමිත සංඥා පුවරු සැපයීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රතිපාදන මගින් සිදු කිරීම සඳහා තෙක් මුදල් 2023.12.31 යෙන් අනුමැතිය ශඅමාත්‍යාං .ලැබී නොමැත | ක්‍රියාකාරී සැලැස්මෙන් බලාපොරොත්තු වන උපරිම අරමුණු එම කාල රාමුවෙන් ම නිම කිරීමට වග බලා ගත යුතු වේ. |
| (ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ දී රථවාහන කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.470,000ක් වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ දී ඒ සම්බන්ධයෙන් කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර ඇති නාගරික ප්‍රවාහන සැළසුම් ව්‍යාපෘතිය මගින් බස් ප්‍රමුඛතා මංතීරු, Park & Ride, Car Pooling වැනි නාගරික ප්‍රවාහන තදබදය අවම කිරීම සඳහා යෝජනා සකස් කිරීමට සැළසුම් කරන ලදී. නමුත් බස් ප්‍රමුඛතා මංතීරු ක්‍රියාත්මත කිරීම හා Park & Ride ව්‍යාපෘති පසුගිය වසරවල ක්‍රියාත්මක කළද එම ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක නොවුන බැවින් වෙනත් විකල්ප ක්‍රමවේදයක් හඳුනාගන්නා තුරු මෙම ව්‍යාපෘතිය යටතේ නාගරික ප්‍රවාහන කළමනාකරණ ක්‍රම හඳුනාගැනීම සම්බන්ධව සමීක්ෂණ සිදු නොකරන ලදී. | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |